මගේ අංකය: ජේඑස්සී/ඊඒ/ස්ථානමාරු 2026

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
සිවිල් අභියාචනා මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
දිසා විනිශ්චයකාරවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් හා අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්,

**<u>උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ ලඝු ලේඛක නිලධාරීන්ගේ</u>**
**<u>වාර්ෂික ස්ථානමාරු අභියාචනා - 2026</u>**

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 ඌ (1) (ආ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව **2026.04.02** දින සිට ක්‍රියාත්මක වන පරිදි උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ සේවයේ අධිකරණ ලඝු ලේඛක නිලධාරීන් සඳහා ලබාදී ඇති ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අභියාචනා පිළිබඳව සලකා බැලීමෙන් පසුව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මෙයට අමුණා ඇති ඇමුණුම - A (Annexure - A) ලේඛනයේ සඳහන් තීරණයන්ට එළඹ ඇත.

02. අධිකරණ සේවා කොමිෂන් සභාවේ තීරණය පරිදි ස්ථාන මාරුවීම් අත්හිටුවා ඇති නිලධාරීන් සහ වෙනත් සේවා ස්ථානවලට අනුයුක්ත කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් අදාළ නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය.

03. ස්ථාන මාරුවීම් ලද ප්‍රසූත නිවාඩු ලබා සිටින නිලධාරිනියන් මුදාහැරීම සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතුය.

- වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබමින් සිටින නිලධාරිනියන් තවදුරටත් අඩ වැටුප් ප්‍රසූත නිවාඩු අයදුම් කරන්නේ නම්, අයදුම්පත්‍ර වර්තමාන සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

- අඩවැටුප් ප්‍රසූත නිවාඩු ලබමින් සිටින නිලධාරිනියන් තව දුරටත් වැටුප් රහිත ප්‍රසූත නිවාඩු අයදුම් කරන්නේ නම් අයදුම්පත්‍ර වර්තමාන සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

- අඩවැටුප් ප්‍රසූත නිවාඩු හෝ වැටුප් රහිත ප්‍රසූත නිවාඩු සම්බන්ධයෙන් වර්තමාන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

- ඒ අනුව ප්‍රසූත නිවාඩු මත සිටින නිලධාරිනියන් ස්ථාන මාරු නියෝග මත වර්තමාන සේවා ස්ථානයෙන් මුදා හැරිය යුත්තේ ඔවුන්ට අනුමත කරන ලද ප්‍රසූත නිවාඩු අවසන් කර වර්තමාන සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමෙන් පසුවය.

04. දැනට ප්‍රසූත නිවාඩු ලැබ සිටීම හේතුවෙන් ඉහත 03හි පරිදි කටයුතු කිරීමෙන් පසු නියමිත දින ස්ථාන මාරු නියෝග ලද සේවා ස්ථානයේ රාජකාරි භාරගැනීම සඳහා <u>වර්තමාන සේවා ස්ථානයෙන් මුදාහැරීමට නොහැකි වන අවස්ථාවන්හිදී එලෙස මුදාහැරීමට නොහැකි නිලධාරීන් කවුරුන්ද යන්න</u> ස්ථාන මාරු ලද සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියාට පිටපතක් සහිතව මා වෙත දැන්වීමට කටයුතු කළ යුතුය.

05. තවද ඉහත 02, 03 සහ 04 ඡේදයන්ට යටත්ව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද ස්ථාන මාරු නියෝග අනුව ස්ථාන මාරු නියෝග ලද සියලුම නිලධාරීන්ට **2026.04.02** දින නව සේවා ස්ථානයේ රාජකාරි සඳහා වාර්තා කිරීමට හැකි වන පරිදි වර්තමාන සේවා ස්ථානයෙන් **<u>මුදා හැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කළ යුතු බවද</u>** අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් අවධාරණය කෙරේ. (ආකෘතිය - I බලන්න.)

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

ප්‍රසන්න අල්විස්
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2026 මාර්තු මස 27 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

ආකෘතිය - I

අධිකරණයේ නම: ......................................................................................

<u>**2026 - වාර්ෂික ස්ථානමාරු ලැබූ අධිකරණ ලඝු ලේඛක නිලධාරීන්**</u>

ඉහත සඳහන් නිලධාරීන් 2026.04.02 දින සිට ස්ථාන මාරු අනුව නව සේවා ස්ථානවල සේවය කිරීමට හැකි වන පරිදි මෙම අධිකරණයෙන් මුදා හරිනු ලබන බව මෙයින් දන්වමි.

පරීක්ෂා කර බලන ලදි.

රෙජිස්ට්‍රාර්ගේ නම : ........................................................................................................................

අත්සන සහ නිල මුද්‍රාව : ........................................................................................................................

....................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා

නිල මුද්‍රාව

.............................................

දිනය